# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2008/11 - 2017 පෙබරවාරි මස 28 වැනි අඟහරුවාදා - 2017.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 6/3/1/370.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම පිළිබඳ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනන්විල නමැති ගමේ, සර්වේ ජනරාල්ගේ මු. පි. අ. ක. 3190 දරන 1997.11.12 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.977 පමණ වන නිශ්ශංකවත්ත, ගොඩපරගහලන්ද නමැති ඉඩමේ මායිම්.

*උතුරට : මිල්ලගහහේන, නිශ්ශංකවත්ත විකුණූ කොටස, පානදුර හොරණ මහා මාර්ගය, මහා මාර්ගයේ සිට කුඹුරට යන මාර්ගය සහ ගොරොක්වත්ත; නැගෙනහිරට* : මහා මාර්ගයේ සිට කුඹුරට යන මාර්ගය, ගොරොක්වත්ත සහ කනේවල ගම් මායිම; *දකුණට* : කනේවල ගම් මායිම සහ මිල්ලගහහේන; *බටහිරට*: මිල්ලගහහේන, නිශ්ශංකවත්ත විකුණූ කොටස සහ පානදුර හොරණ මහා මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් 2017 අප්‍රේල් මස 07 වැනි දින පූර්වභාග 10.00 ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2017 මාර්තු මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයෙන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ඒ. කමල් පුෂ්පකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2017 පෙබරවාරි මස 15 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03-489

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* උදු 2/2/10/113.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* LD/05/2006/VE/335.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දි සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශ්‍යතාවයේ විස්තර-*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිගංකුඹුර ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි මීතොටහේන (අමුහේන, වටගොඩ හේන, උඩපතන, තණහේනේහේන, ගල්ඔරුවේ හේන) නම් වූ සර්වේ ජනරාල්ගේ අංක අ.ග.පි. 369 අති. 14 පත්‍ර 14 හි ලඟ දරන පිඹුරේ කැබලි අංක 562, 563, 564, 565, 566, 567, 568, 569, 570, 571, 572, 573, 574, 575, 576, 577, 578, 579, 580, 581, 582, 583, 584, 585, 586, 587, 588 න් දැක්වෙන හෙක්ටයාර් 7.0196 ක් වූ ඉඩම.

*හිමිකම් කියන අය :* පී. එන්. ඩබ්. කුමාරිහාමි මිය, අංක 6, නුවර පාර, උඩදුම්බර. ජී. එන්. ජී. ප්‍රේමාවතී මිය, අංක 455, පහළ ඔගස්ටාවත්ත, දංගොල්ල, මහනුවර, හිමිකම් සනාථ කළ හැකි වෙනත් තැනැත්තන්.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් 2017.04.24 වැනි දින පෙ.ව. 10.00 ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2017.04.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශ්‍යතාවයන්ට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සුජානී ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2017 පෙබරවාරි 13 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03-490

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.